ජාතික ඉතිරි කිරීමේ බැංකුව - 2016
-------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ හා එහි පරිපාලිතයෙහි ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ 37 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන මවිසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් විගණනය කරන ලදි.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම
------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම
--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය - බැංකුව

මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

මතය - සමූහය

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින්, 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ හා එහි පරිපාලිතයෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූල වීම

2016 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි ඉදිකිරීම් හා සම්බන්ධ කෙරීගෙන යන වැඩ වටිනාකම වූ රු. මිලියන 77.28 තුළ මහල් 18 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා දරන ලද රු.මිලියන 35.23 ක ප්‍රාග්ධන වියදමක් ඇතුලත් වූ අතර, මෙම ගොඩනැගිල්ල වෙනත් ඉඩමක ඉදිකිරීමට කළමනාකරණය තීරණය කිරීම හේතුවෙන් එහි ඉදිකිරීම් වැඩ 2016 දෙසැම්බර් 31 දිනට නතර කර තිබුණි. එහෙත්, එහි භාවිතයේ අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකි නිසා, ඉහත ඉදිකිරීමේ වැඩ වෙනුවෙන් දරන ලද පිරිවැය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 පරිදි ඉවත්කර නොතිබුණි. තවද, ඒ සඳහා දරන ලද වියදම ඵල රහිත වියදමක් ලෙස දැක්විය හැක.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

බැංකුව 1999 වර්ෂයේදී රු. 200,000 ක් වැය කර ඔප්පු අංක 224 හා 225 මගින්, පර්චස් 28.14 ක ප්‍රමාණයකින් යුත් මහියංගනයේ ඉඩම් දෙකක් අත්පත් කරගෙන තිබුණි. කෙසේ වුවද, මෙම ඉඩම්වල වටිනාකම නිදහස් වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි. එම ඉඩම් වල පිහිටි ගොඩනැගිලි දෙකක් රු. මිලියන 1.6 කට ප්‍රත්‍යාගණනය කර තිබුණද, එම ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා සැලකිල්ලට ගෙන නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්වැප් පිරිවැය ලෙස බැංකුව විසින් 2016 වර්ෂයේදී ගෙවන ලද එකතුව රු. මිලියන 1,245. 899 ක් පිළිවෙලින් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙන් සහ මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස පෙන්වා තිබුණි. මෙම ප්‍රමාණය අය කර ගැනීම සම්බන්ධයෙන් ලේඛනගත සාක්ෂි නොමැති වීමෙන්, 2017 වර්ෂයේ පළමු කාර්තුව වෙනුවෙන් භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශ වලින් මෙම ප්‍රමාණය අයකර ගැනීමට කළමනාකරණය තීරණය කර තිබුණි.

(ආ) **2016** දෙසැම්බර් **31** දිනට වංචනික ආපසු ගැනීම් රු. මිලියන **95.5** ක් හිඟහිට පැවති අතර, පෙර වර්ෂය හා සැසඳීමේදී එය රු. මිලියන **1.2** කින් හෙවත් සියයට **1.27** කින් වැඩි වී තිබුණි. මේ අතරින් රු. මිලියන **95** ක් වර්ෂයකට වඩා වැඩි කාලයක් හිඟව පැවති අතර රු. මිලියන **8.8** ක් වසර පහකට වැඩි කාලයක් පුරා හිඟව පැවතුණි.

## 2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත** | |
| (i) **47** වන වගන්තිය | වර්ෂ **10** කට වඩා වැඩි කාලයක් අක්‍රියව පවත්නා තැන්පතු "හිමිකම් නොපෑ සංචිත" ගිණුමට මාරු කළ යුතුය. කෙසේ වුවද, එම ගිණුමට මාරුකිරීමෙන් තොරව රු. මිලියන **1,282.6** ක මුදලක් **2016** දෙසැම්බර් **31** දිනට මූල්‍ය ප්‍රකාශනවල අක්‍රිය ලෙස පැවතුණි. |
| **(ii) 47 (4)** වගන්තිය | හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කල මුදලින් ගණුදෙනුකරුවන්ට ගෙවූ මුදල්, භාණ්ඩාගාර ලේකම් විසින් ඒකාබද්ධ අරමුදලින් බැංකුවට හැකි තරම් ඉක්මනින් ගෙවිය යුතුය. බැංකුව විසින් **2000 - 2016** දක්වා කාලය ඇතුලත රු. මිලියන **1,115.43** ක් එලෙස ගෙවා තිබුණද, **2017** අගෝස්තු **31** දක්වාත් භාණ්ඩාගාර ලේකම් විසින් එම මුදල් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. |
| **(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006** | |
| (i) **2.1.2** මාර්ගෝපදේශය | සියලු ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් විසින් ඒවායේ පළමු රැස්වීමේදී නියමිත ආකෘති ප්‍රකාශනයක අත්සන් තැබීම අවශ්‍යවන අතර, එම ප්‍රකාශන වර්ෂ **05** ක කාලයක් සඳහා සුරක්ෂිතව තබාගත යුතුය. කෙසේ වූවද, පහත සඳහන් ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් එවැනි ප්‍රකාශනයන් ලබා දී නොතිබුණි.<br>• රු. මිලියන **5.33** කට ටී -සර්ට් මිලට ගැනීම<br>• රු.මිලියන **50.57** කට තොරතුරු තාක්ෂණ උපකරණ මිලට ගැනීම.<br>• රු.මිලියන **4.65** කට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මිලට ගැනීම<br>• රු. මිලියන **8** කට යතුරුපැදි මිලට ගැනීම.<br>• රු.මිලියන **2.58** කට කැකිරාව ශාඛාව ප්‍රතිසංස්කරණය කිරීම. |
| (ii) **5.3.10** මාර්ගෝපදේශය | කොන්ත්‍රක් වටිනාකම රු. මිලියන **5** ට වැඩි හා රු. මිලියන **25** ට අඩු කොන්ත්‍රාත් සඳහා ලංසු වලංගු කාලසීමාව දින **77**ක් වුවද, රු. මිලියන **5.33** ක පිරිවැයක ටී- සර්ට් මිලට ගැනීමට ප්‍රසම්පාදනයේදී බැංකුව දින **180** ක් ලබා දී තිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | **5.4.8, 8.12.1** හා **8.12.13** මාර්ගෝපදේශයන් | ප්‍රයෝජනයට ගත නොහැකි බවට ශාඛාවන් විසින් ප්‍රතික්ෂේප කර තිබූ, රු. **516,615** කට මිලට ගත් රන් කූරු **11** ක වටිනාකම, ඒවායේ සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද කාර්යසාධන සුරක්ෂණයෙන් අය කර ගෙන නොතිබුණි. මෙම රන් කූරු බැංකුවේ අවශ්‍යතාවයන්ට අනුකූල බවට පරීක්ෂා කර සහතිකයක් කාර්යය භාර නිලධාරීන් විසින් නිකුත් කර නොතිබුණි. |
| (iv) | **5.3.10** මාර්ගෝපදේශය හා කොන්ත්‍රාත් ප්‍රදාන ලිපියේ **10** වන වගන්තිය | කොන්ත්‍රාකත් වටිනාකම රු. මිලියන **2** ට වැඩි හා රු. මිලියන **5** ට අඩු කොන්ත්‍රාත් සඳහා ලංසු වලංගු කාලය දින **63** කි. කෙසේ වුවද, රු. **2,583,162** ක වටිනාකමකට කැකිරාව ශාඛාව ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේදී දින **150** ක් ලබා දී තිබුණි.<br><br>කාර්යසාධන සුරක්ෂණයක්, කොන්ත්‍රාත්තුව නිම කිරීමට නියමිත දිනයෙන් පසුව දෝෂ නිවැරදි කිරීමේ මාස **06** ක කාලය අවසානය දක්වා වලංගු විය යුතුය. කෙසේ වුවද, මෙම කොන්ත්‍රාත්තුව සඳහා සපයන ලද සුරක්ෂණයේ වලංගු කාලය මාස **04** ක් පමණක් විය. |
| (ඇ) | කොන්ත්‍රක් ගිවිසුමේ **33** වන වගන්තිය | සැපයුම්කරුවකු සැපයීමට එකඟ වූ කාල සීමාව තුළ භාණ්ඩ සැපයීමට අපොහොසත් වන්නේ නම් දිනකට රු. **1,000** ක ප්‍රමාද ගාස්තුවක් අය කළ යුතුය. කෙසේ වුවද, රු. මිලියන **50.567** ක වටිනාකමක පරිගණක උපකරණ දින **28** සිට දින **92** ක් දක්වා වූ ප්‍රමාදයක් සහිතව සැපයීමේදී එවැනි ගාස්තුවක් සැපයුම්කරුගෙන් අයකරගෙන නොතිබුණි. |

**3.** මූල්‍ය සමාලෝචනය
---------------------

**3.1** මූල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන **13,303** ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන **13,034** ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන **269** ක වර්ධනයක් දැක්වුණි.

සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ පරිපාලිතයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන **109** ක බදු පෙර ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන **253** ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන **144** ක පිරිහීමක් දැක්වුණි. ප්‍රතිමිලදී ගැණුම් මත වන පොලී වියදම රු. මිලියන **183** කින් හෙවත් සියයට **49** කින් වැඩි වීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට බලපාන ප්‍රධාන හේතුවක් විය.

බැංකුවේ අගය එකතු කිරීමේ ප්‍රකාශනය අනුව, **2016** වර්ෂයේ අගය එකතු කිරීම රු. මිලියන **23,197** ක් වූ අතර, **2015** වර්ෂයට සාපේක්ෂව සියයට **0.75** ක වැඩි වීමක් එයින් දැක්වුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

(අ) වැදගත් ගිණුම්කරණ අනුපාත


ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා බැංකුවේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් ආංශික අනුපාතයන් සමඟ පහත දැක්වේ.

| | | ආංශික අනුපාත* | 2016 | 2015 |
|---|---|---|---|---|
| **ලාභදායීත්ව අනුපාත** | | | | |
| (i) | සාමාන්‍ය කොටස් අයිතිකරුවන්ගේ අරමුදල මත ප්‍රතිලාභ ( ROE ) (ප්‍රතිශතය) | 16.73 | 29.37 | 31.15 |
| (ii) | සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය( ROA ) (ප්‍රතිශතය) | 2.09 | 1.5 | 1.6 |
| (iii) | ශුද්ධ පොළී ආන්තිකය | 3.6 | 2.98 | 3.32 |
| (iv) | මෙහෙයුම් වියදම් වලට සාපේක්ෂව කාර්යමණ්ඩල පිරිවැය | 44.91 | 60.28 | 56.75 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය** | | | | |
| (i) | ප්‍රාග්ධන ප්‍රමාණාත්මක - පෙළ I (අවම සියයට 5) | 13.59 | 12.53 | 17.83 |
| (ii) | ප්‍රාග්ධන ප්‍රමාණාත්මක - පෙළ II (අවම සියයට 10) | 15.72 | 14.68 | 16.34 |
| **ද්‍රවශීලතා අනුපාත** | | | | |
| | ද්‍රවශීල වත්කම් අනුපාතය (ප්‍රතිශතය) | 34.22 | 72.6 | 81.08 |

* ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු ක්ෂේත්‍රය සඳහා ප්‍රසිද්ධ කරන ලද වාර්ෂික සංඛ්‍යාලේඛන පිළිබඳ වර්ෂ 10 ක සාමාන්‍යය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෙර වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය හා ශුද්ධ පොළී ආන්තිකය පිළිවෙලින් සියයට 0.1 කින් හා සියයට 0.34 කින් වැඩි වී තිබුණ ද, 2016 වර්ෂයේදී ඒවා ආංශික අනුපාතයන්ට වඩා අඩු වී තිබුණි. 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ශුද්ධ පොළී ආන්තිකයේ ප්‍රවණතාවය පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ.



(ii) පෙර වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී, පොළී ආදායම රු. මිලියන 8,261 කින් හෙවත් සියයට 11 කින් වැඩි වී තිබුණි. ඒ අතරතුර සමාලෝචිත වර්ෂයේ පොළී ආදායමේ සියයට 8 ක සෘණ වැඩිවීමක් දක්වමින් පොළී වියදම රු.මිලියන 9,777 කින් හෙවත් සියයට 19 කින් වැඩි වී තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ පොළී ආදායම රු.මිලියන 1,516 කින් හෙවත් සියයට 18 කින් අඩු වී තිබුණි.

(iii) ආංශික අනුපාතය සමඟ සැසඳීමේදී ද්‍රවශීලතා අනුපාතය ඉහළ අගයක පැවතුණද, එය 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී, සියයට 8.48 කින් අඩු වී තිබුණි.

(iv) පෙර වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂය අවසානයට බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත (පෙළ 1හා පෙළ 2) පිළිවෙලින් සියයට 5.3 හා සියයට 1.66 බැගින් පිරිහී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම අනුපාත ප්‍රමිති අනුපාත වලට සාපේක්ෂව තරමක් පිටුපසින් පැවතුණි.

(ආ) ලාභදායිතාවය
---------------

(i) ශාඛා 197 ක, තැපැල් ශාඛා 11 ක, අංශ 03 ක හා ප්‍රධාන කාර්යාලයේ බදු පෙර ලාභයේ එකතුව රු. මිලියන 16,642 කින් හා ශාඛා 41 ක, එක් තැපැල් ශාඛාවක හා අංශ 2 ක ශුද්ධ පාඩුවේ එකතුව රු. මිලියන 617.79 කින් සමන්විත සමාලෝචිත වර්ෂය සඳහා බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 13,303 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ සමස්ත ආදායම රු. මිලියන 87,399 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එය රු. මිලියන 79,282 ක් වූයෙන් සමස්ත ආදායමේ රු. මිලියන 8,117 ක හෙවත් සියයට 10.2 ක වැඩි වීමක් පෙන්නුම් කෙරිණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

### 4.1 බැංකුවේ කාර්ය සාධනය
--------------------------

විශේෂයෙන් සීමිත හැකියාව ඇති ශ්‍රී ලංකාවේ ජනතාව අතර ඉතිරි කිරීම් ප්‍රවර්ධනය හා එසේ එක්රැස් කරනු ලබන ඉතුරුම් ලාභදායිව ආයෝජනය කිරීම බැංකුවේ ප්‍රධාන අරමුණ විය.
ලබාගත හැකි වූ තොරතුරු අනුව, ඉහත අරමුණු ඉටු කිරීම සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>බැංකුවේ තැන්පතු පදනම</u>


බැංකු අංශය හා බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයට සාපේක්ෂව, බැංකුවේ තැන්පතු (ඉතුරුම්) පදනම හා වෙළඳපොළ කොටස පහත දැක්වේ.

| වර්ෂය | තැන්පතු | | | වෙළඳපල කොටස | |
|---|---|---|---|---|---|
| | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | බැංකු අංශය | බලපත්‍ර ලාභී විශේෂිත බැංකු අංශය | බැංකු අංශයේ ප්‍රතිශතයක් ලෙස | බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයේ ප්‍රතිශතයක් ලෙස |
| | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | | |
| 2016 | 657,280 | 6,295,559 | 846,146 | 10.4 | 77.7 |
| 2015 | 595,776 | 5,403.131 | 764,155 | 11.0 | 77.9 |
| 2014 | 554,060 | 4,686,306 | 709,671 | 11.8 | 78.1 |
| 2013 | 501,890 | 4.169.520 | 617,081 | 12.0 | 81.3 |
| 2012 | 457,650 | 3,625,374 | 564,077 | 12.6 | 81.1 |
| 2011 | 411,013 | 3,072,544 | 513,813 | 13.4 | 79.9 |
| 2010 | 355,364 | 2,586,032 | 432,606 | 13.7 | 82.1 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 වර්ෂයේ සිට 2016 දක්වා බැංකු අංශයේ තැන්පතු පදනම සියයට 143 කින් වැඩි වී තිබුණද, බැංකුව එම කාලය තුළ සියයට 85 ක වර්ධනයක් පමණක් ළඟාකරගෙන තිබුණි. එමනිසා වර්ෂ හතක කාලය තුළ සියයට 13.7 සිට සියයට 10.4 දක්වා බැංකුවේ වෙළඳපල කොටස පහත වැටුණි.

(ii) බැංකුවේ තැන්පතු පදනමේ වාර්ෂික වර්ධනය (වර්ෂයෙන් වර්ෂයට) මඟින්, බැංකු අංශයේ වර්ධනයට සාපේක්ෂව බැංකුව පසුපසින් සිටින බව පෙන්නුම් කෙරිණි. එය පහත ප්‍රස්ථාරයෙන් නිරූපණය කෙරේ.




(iii) බැංකුව පසුගිය වර්ෂ 04 ක කාල සීමාවේ හා සමාලෝචිත වර්ෂයේ දී එහි අරමුණු ගත ඉතුරුම් වර්ධන අනුපාත ළඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

(iv)

| වර්ෂය | අපේක්ෂිත වර්ධන අනුපාතය (ප්‍රතිශතය) | සත්‍ය වර්ධන අනුපාතය (ප්‍රතිශතය) |
|---|---|---|
| **2015/16** | **12** | **10.3** |
| **2014/15** | **12.7** | **7.5** |
| **2013/14** | **12.1** | **10.4** |
| **2012/13** | **13.5** | **9.7** |
| **2011/12** | **14.2** | **11.3** |

(ආ) බැංකුවේ වත්කම් මත පදනම් වෙළඳපළ කොටස

ඉකුත් වර්ෂ හතක හා සමාලෝචිත වර්ෂය සඳහා බැංකු අංශය සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයට සාපේක්ෂව , බැංකුවේ වත්කම් පදනම් වෙළඳපළ කොටස පහත දැක්වේ.

| වර්ෂය | බැංකු අංශයේ ප්‍රතිශතයක් ලෙස | බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| **2016** | **10.07** | **75.77** |
| **2015** | **10.50** | **76.39** |
| **2014** | **11.18** | **71.68** |
| **2013** | **11.01** | **71.18** |
| **2012** | **10.00** | **68.64** |
| **2011** | **10.97** | **69.26** |
| **2010** | **11.38** | **70.14** |

ඒ අනුව **2013** හා **2014** වර්ෂ වලදී සියයට **11** ට වැඩි වූ බැංකුවේ වත්කම් මත පදනම් වූ වෙළඳපළ කොටස ඉන් අනතුරුව අඩු වන ප්‍රවණතාවයක් පැවතුණි. කෙසේ වුවද, **2015** හා **2016** වර්ෂ වලදී බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශය තුළ වත්කම් මත පදනම් වෙළඳපළ කොටස සියයට **75** ට වඩා වැඩියෙන් පවත්වා ගැනීමට බැංකුවට හැකි වී තිබුණි.

(ඇ) ඉතුරුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ ඉතුරුම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ කාර්ය සාධනය පහත දැක්වේ.

| | **2016** | **2015** |
|---|---|---|
| ශාඛා සංඛ්‍යාව | **250** | **245** |
| ගිණුම් හිමියන් සංඛ්‍යාව (මිලියන) | **19.285** | **18.808** |
| ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව | **279** | **271** |
| පාසැල් බැංකු ඒකක | **2,858** | **2,287** |

බැංකුව, වර්ෂය තුළදී නව ශාඛා 05 ක් විවෘත කර තිබූ අතර ගිණුම් හිමියන් සංඛ්‍යාව 477,000 කින් 2016 වර්ෂය තුළ වැඩි වී තිබුණි. එසේම, පෙර වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී ඉතුරුම් ප්‍රමාණය සියයට 10.3 කින් වර්ධනය වී තිබුණි. කෙසේ වුවද, එම කාලය තුළ සියයට 16.5 ක වර්ධනයක් බැංකු අංශය ලබාගෙන තිබුණි.

## 4.2 මෙහෙයුම් දුර්වලතා

---------------------

### (අ) ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම - 2013 සහ 2014 වර්ෂ

---------------------------------------------------------

2012 දෙසැම්බර් 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, නැවත ගෙවීමේ සහ ව්‍යාපෘතීන් මූල්‍යයනය කිරීම සඳහා අදාල ණය යොදා ගැනීමේ හැකියාව පවතින, රජය සතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යවසායන්වලට අරමුදල් සැපයීමට එක්සත් ජනපද ඩොලර් මිලියන 1,000 ක් වූ ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, 2013 වර්ෂයේදී බැංකුව විසින් එක්සත් ජනපද ඩොලර් මිලියන 750 ක් වටිනා හා 2014 වර්ෂයේදී එක්සත් ජනපද ඩොලර් මිලියන 250 ක් වටිනා ජාත්‍යන්තර බැඳුම්කර පිළිවෙලින් වර්ෂයකට සියයට 8.875 ක හා සියයට 5.15 ක පොළී අනුපාතයකට නිකුත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. බැංකුවේ දීමනා කොන්දේසි ලියවිල්ලට ( Offering Memorandum) අනුව එක්සත් ජනපද ඩොලර් මිලියන 750 ක් වූ බැඳුම්කර මුදල් වලින් සියයට 50 ක් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලද, ඉතිරි ශේෂය ඩොලර් නාමික ණය හා රුපියල් නාමික ණය වශයෙන් සමානව රාජ්‍ය අයිතිය ඇති ව්‍යවසායන් සහ රජය සතු හෝ පාලනය කරන ව්‍යාපෘතිවලට ලබා දීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද, 2016 වර්ෂය අවසන් වන විට බැඳුම්කරවලින් ලද මුදලින් එක්සත් ජනපද ඩොලර්. මිලියන 57.91 ක් අපේක්ෂිත අරමුණ සඳහා උපයෝජනය කර නොතිබුණි.

ii. බැංකුවේ බඳු දීමනා කොන්දේසි ලියවිලිවල අවශ්‍යතාවයන් වලට අනුකූල නොවී, එක්සත් ජනපද ඩොලර් මිලියන 250 ක බැඳුම්කරවලින් ලැබුණු මුළු මුදල් ප්‍රමාණයම, එම මුදල් ලැබුණු දින සිට භාණ්ඩාගාර බැඳුම්කර හා ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය දක්වා වර්ෂ තුනක කාලයක් තුළ මෙම බැඳුම්කර වෙනුවෙන් දරන ලද වියදම සහ බැඳුම්කරවලින් ලැබුණු මුදල් ආයෝජනය මත වන ආදායම පහත දැක්වේ.

| වර්ෂය | බැඳුම්කර වල වටිනාකම<br>රු. | මුළු ආදායම<br>රු. | ප්‍රතිශතය | මුළු වියදම<br>රු. | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2014 | 32,966,250,000 | 917,907,255 | ***9.32 | 534,033,203 | ***5.42 |
| 2015 | 36,015,000,000 | 2,962,110,449 | 8.22 | 1,764,281,301 | 4.90 |
| 2016 | 37,437,500,000 | 3,026,575,503 | 8.08 | 1,890,383,656 | 5.05 |

*** දින 109 කට අදාල පොළී ආදායම/වියදම වර්ෂයකට හැරවීමෙන් ප්‍රතිශතය ලබා ගෙන ඇත.

ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී සියයට 8.22 සිට සියයට 8.08 දක්වා ආදායම අඩු වී තිබුණු අතර බැඳුම්කරවල සඵල පිරිවැය සියයට 0.15 කින් වැඩි වී තිබුණි. තවද, සියයට 3.32 සිට සියයට 3.03 දක්වා ශුද්ධ ලාභය අඩු වී තිබුණි.

(ආ) එ.ජ.ඩො.මිලියන 1,000 ක ජාත්‍යන්තර බැඳුම්කරවල සමස්ත ආදායම හා වියදම

2016 දෙසැම්බර් 31 දක්වා ඉහත බැඳුම්කර වෙනුවෙන් පොළී හා වෙනත් වියදම් ලෙස සමස්ත එකතුව රු. 34,341,748,631ක මුදලක් බැංකුව දරා තිබූ අතර, එම කාලය තුළ බැඳුම්කරවලින් ලැබුණු මුදල් ආයෝජනයෙන් රු. 43,504,850,168 ක ආදායමක් උපයාගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | මූල්‍ය ප්‍රකාශ අනුව වර්ෂය අවසානයට බැඳුම්කර වල මුළු වටිනාකම රු. | මුළු පොළී හා වෙනත් වියදම් රු. | ප්‍රතිශතය | මුළු පොළී ආදායම රු. | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2013 | 98,250,000,000 | 2,559,549,750 | ***9.06 | 3,153,860,053 | ***11.16 |
| 2014 | 131,865,000,000 | 9,248,552,817 | 7.01 | 13,155,256,934 | 9.98 |
| 2015 | 144,060,000,000 | 10,874,010,110 | 7.55 | 13,818,036,954 | 9.59 |
| 2016 | 149,750,000,000 | 11,659,635,954 | 7.79 | 13,377,696,227 | 8.93 |
| එකතුව | | 34,341,748,631 | | 43,504,850,168 | |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය අවසානයට බැඳුම්කරවල සාමාන්‍ය වියදම සියයට 7.79 ක් විය. එසේම, විනිමය අනුපාත අවප්‍රමාණය වීම හේතුවෙන් 2016 වර්ෂය තුළදී බැඳුම්කර වටිනාකමට සාපේක්ෂව මුළු වියදම සියයට 0.24 කින් වැඩි වී තිබුණි. තවද, 2018 සහ 2019 වර්ෂවල බැඳුම්කර පරිණත වන විට, ආයෝජකයන්ට මුදල් ගෙවීමට ඩොලර් මිලට ගැනීම වෙනුවෙන් කිසිදු අනාගත විනිමය අනුපාත ගිවිසුමකට බැංකුව ඇතුළත් වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී, 2016 වර්ෂයේදී උපයන ලද සාමාන්‍ය මුළු ආදායම සියයට 9.59 සිට සියයට 8.93 දක්වා සියයට 0.66 කින් පහත බැස තිබුණි. සාමාන්‍ය මුළු ආදායම සියයට 8.93 ක් හා සාමාන්‍ය මුළු වියදම සියයට 7.79 ක් වීම නිසා 2016 වර්ෂය අවසන්වන විට බැංකුවට සියයට 1.14 ක ලාභයක් ලබා ගැනීමට හැකිව තිබුණි.

## 4.3 ප්‍රමාද වූ ඉදිකිරීම් වැඩ

ශාඛා 04 ක් ඉදිකිරීම පිළිබඳව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණද (2011 වර්ෂයේ ශාඛා 03 ක්, සහ 2012 වර්ෂයේ එක් ශාඛාවක්) 2016 දෙසැම්බර් 31 දක්වාත් එම ශාඛාවල ඉදිකිරීම් වැඩ අවසන් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම ශාඛා පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත ගොඩනැගිලි ලබා ගැනීම වෙනුවෙන් රු. මිලියන 11.22 ක කුලියක් ගෙවීමට සිදු වී තිබුණි. නිශ්චිත කාල පරිච්ඡේදය තුළ දී ඉදිකිරීම් වැඩ නිම කළේ නම්, එම කුලී ගෙවීම ඉතිරි කර ගත හැකිව තිබුණි.

## 4.4 ණය පරිපාලනය

### 4.4.1 අක්‍රීය ණය (Non-Performing Loans)

ඉකුත් වර්ෂයේදී රු. මිලියන 236,033 ක් හා රු. මිලියන 9,055 ක් වූ මුළු හිඟ හිටි ණය හා අක්‍රීය ණය ශේෂ වර්ෂය අවසාන වන විට රු. මිලියන 280,718 ක් හා රු.මිලියන 4,774 ක් විය.

**මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී රු. මිලියන 280,718 ක් වූ ණය පහසුකම් බැංකුව විසින් ලබා දී තිබූ අතර ඉන් රු. මිලියන 4,774 ක් හෙවත් සියයට 1.70 ක් අක්‍රීය ණය ලෙස දැක්වුණි. තවද, 2016 දෙසැම්බර් 31 දිනට මුළු උකස් ණයවලින් එකතුව රු. මිලියන 2,348 ක් හෙවත් සියයට 12.37ක් අක්‍රීය ණය ලෙස වාර්තා විය.**

**(ආ) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව යටතේ (SLLRDC) වෙරස් ගඟ ජල ප්‍රවාහන ව්‍යාපෘතියට මූල්‍ය පහසුකම් සැපයීම**

**2013 ජූනි 26 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඉහත ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 14,227ක ණය පහසුකමක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 සහ 2015 වර්ෂ වෙනුවෙන් වන පොළී ගෙවීම් විලම්භිත කර අර්ධ වාර්ෂික පදනම මත ප්‍රාග්ධනිත කිරීමට ද අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව 2014 වර්ෂය තුළ රු. මිලියන 2,550 ක ණය මුදලක් ලබා දී තිබුණු අතර රු. මිලියන 248 ක ප්‍රාග්ධනිත පොළිය සහ රු. මිලියන 2,550 ක මුළු ණය නිදහස් කිරීම් ද ඇතුළත්ව රු. මිලියන 2,798 ක මුදලක් අය වීමට තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(i) මූලිකව රු. මිලියන 14,227 ක මුදලක් අනුමත කර තිබුණද. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ණය පහසුකම රු. මිලියන 11,050 දක්වා අඩු කර තිබුණි. ණය ගිවිසුමට අනුව 2016 ඔක්තෝබර් 24 පටන් ප්‍රාග්ධනය නැවත ගෙවීම ආරම්භ කිරීමට නියමිතව පැවතුණු අතර වාරිකයක වටිනාකම රු.මිලියන 592.79 ක් විය. කෙසේ වුවද, ප්‍රාග්ධනය නැවත ගෙවීමේ සහන කාල සීමාව බැංකුව විසින් 2018 අප්‍රේල් 23 දක්වා දීර්ඝ කර තිබුණි.**

**(ii) ණය ගිවිසුම පරිදි සියයට 4 ක දඩ පොළියක් අය කළ යුතු වුවද, රු.4, 252,462 ක් වූ එවැනි දඩ පොළී අත් හරින ලෙස 2017 මාර්තු 03 දිනැති ලිපියක් මගින් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ඉල්ලා තිබුණි. කෙසේ වුවද, 2017 ජූනි වන තුරු එම ලිපියට බැංකුව ප්‍රතිචාර දක්වා නොතිබුණි.**

**4.4.2 අක්‍රීය ණයවල වයස් විශ්ලේෂණය**

**----------------------------------**

**පහත නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) 2016 දෙසැම්බර් 31 දිනට මුළු අක්‍රීය ණය රු. මිලියන 4,774.43 ක් වූ අතර ඉන් රු. මිලියන 313.81 ක් හෙවත් සියයට 6.57 ක් වර්ෂ 03 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.**

**(ආ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට වර්ෂ පහකට වැඩි අක්‍රීය ණය රු. 115.38 ක් වූ අතර ඉන් රු. මිලියන 88.15 ක් හෙවත් සියයට 76.4 ක් නිවාස ණය නියෝජනය විය.**

**(ඇ) රු. මිලියන 7.81 ක් වූ "රට ඉතුරු ණයවල" අක්‍රීය ණය ශේෂයෙන්, රු. මිලියන 4.13 ක් හෙවත් සියයට 53 ක් වර්ෂ පහකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.**

**(ඈ) 2016 වර්ෂය අවසන් වන විට, පිළිවෙලින් සියයට 21 ක්, සියයට 08 ක් හා සියයට 17 ක් අක්‍රීය නිවාස ණය, රාජ්‍ය ණය හා ඇපමත ලබා දුන් පුද්ගලික ණය නියෝජනය විය.**

(ඉ) මුළු අක්‍රීය ණය ශේෂයෙන් සියයට 49 ක් හෙවත් රු. මිලියන 2,348.43 ක් උකස් අත්තිකාරම් නියෝජනය විය. තවද, අක්‍රීය උකස් අත්තිකාරම්වලින් සියයට 95 ක්, වසර 1 සිට 3 දක්වා පරාසයක් අතර හිඟ හිට පැවතුණි.

(ඊ) 2016 දෙසැම්බර් 31 දිනට දෙන ලද මුළු උකස් අත්තිකාරම්වලින් සියයට 40 කට වඩා වැඩි අක්‍රීය උකස් අත්තිකාරම් පවතින ශාඛා 06 ක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ශාඛාව | මුළු උකස් අත්තිකාරම් රු. | මුළු අක්‍රීය ණය අත්තිකාරම් රු. | අක්‍රීය ණය අත්තිකාරම් මුළු අත්තිකාරම් වල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| කැකිරාව | 92,976,504 | 42,136,045 | 45 |
| මන්නාරම | 68,086,128 | 27,882,329 | 41 |
| තලවකැලේ | 70,574,540 | 33,182,521 | 47 |
| වත්තල | 137,425,646 | 66,014,173 | 48 |
| පුඩළුඔය | 15,976,402 | 7,891,114 | 49 |
| පොතුවිල් | 6,306,664 | 4,143,417 | 78 |

**4.5** මතභේදයට තුඩු දෙන ගණුදෙනු

ඉඩම් 08 ක නීත්‍යානුකූල අයිතිය බැංකුවට ලබා ගැනීමෙන් තොරව එම ඉඩම්වල ගොඩනැගිලි ඉදි කිරීම වෙනුවෙන් බැංකුව රු. මිලියන 83.6 ක් වැය කර තිබුණි.

**4.6** වංචනික ස්වභාවයේ ගණුදෙනු

2016 වර්ෂය අවසාන වන විට බැංකුවේ වංචනික ස්වභාවයේ ගණුදෙනුවල වටිනාකම රු. 95,524,914 ක් වූ අතර ඉන් අවස්ථා 26 කට සම්බන්ධ රු.47,299,260 කට බැංකුවේ නිලධාරීන් ඍජුවම සම්බන්ධ වී තිබුණි. එසේම, මින් රු. 18,914,481 ක් හෙවත් සියයට 20 ක් අඩු කැරට් ප්‍රමාණයේ රන් භාණ්ඩ මත ලබා දුන් උකස් ණය හා සම්බන්ධ විය. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා සිදු කළ වංචනික මුදල් ආපසු ගැනීම්වලට සම්බන්ධ රු. 42,984,600 ක් පැවති බවද තවදුරටත් නිරීක්ෂණය විය.

**4.7** මානව සම්පත් කළමණාකරණය

(අ) බැංකුවේ කාර්යය මණ්ඩල තත්ත්වය
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට බැංකුවේ අනුමත සේවක සංඛ්‍යාව 4,846 ක් වූ අතර බැංකුව විසින් ස්ථිර කර්යය මණ්ඩලය 3,286 ක් හා කොන්ත්‍රාත් පදනම මත 1,098 ක් ද ඇතුළත් සේවකයින් 4,384 ක් සේවයේ යොදවා තිබුණි. ඒ අනුව, 2016 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 594 ක් හා අතිරික්ත 132 ක කාර්යමණ්ඩලයක් පැවතුණි.

(ii) විධායක ශ්‍රේණියේ පුරප්පාඩු 260 ක් හෙවත් සියයට 31 ක් නිරීක්ෂණය වූ අතර එම තනතුරු 2016 වර්ෂය අවසානය වන විටත් පිරවීමකින් තොරව පුරප්පාඩුව පැවතුණි. ඉහත පුරප්පාඩු තනතුරු තුළ සහකාර සාමාන්‍යාධිකාරවරු 10 ක්, ප්‍රධාන කළමණාකරුවන් 23ක්, ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් 33 ක් හා සහකාර කළමණාකරුවන් 183 ක් ඇතුළත් විය. බැංකුවේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා මෙය අහිතකර ලෙස බලපා තිබුණි.

(iii) 2016 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තත්ත්වය තුළ සේවක සංඛ්‍යාවෙන් තනතුරු 2,221 ක් හෙවත් සියයට 51 ක් බැංකු සහායක තනතුරුවලින් නියෝජනය විය. වෙනත් රාජ්‍ය අංශයේ බැංකු අනුගමනය කරනු ලබන සමාන ක්‍රමයක් වූ තරඟකාරී විභාගයක් පැවැත්වීමකින් තොරව සම්මුඛ පරීක්ෂණයක් පදනම් කරගෙන වයස 25 ට අඩු වන බැංකු සහයකයන් පත් කිරීමට බැංකුව තීරණය කර තිබුණි.

(iv) සුදුසුකම් ඇති අපේක්ෂකයන්ට අයදුම් කිරීමට කිසිදු ප්‍රසිද්ධ දැන්වීමක් ලබා නොදී කළමණාකරණය විසින් සපයන ලද ලැයිස්තුවක් මත පදනම්ව සම්මුඛ පරීක්ෂණයක් සඳහා අයදුම්කරුවන්ට ආරාධනා කර තිබුණි.

(v) 2016 පෙබරවාරි සිට ක්‍රියාත්මක වන පරිදි වයස් සීමාව අවුරුදු 30 දක්වා වැඩි කිරීම මගින් බැංකු සහයකයන් 21 ක් බඳවා ගෙන තිබුණි. එසේම, සුදුසුකම් ලැබීම සඳහා ලබා ගත යුතු ලකුණු 40 ක ප්‍රමාණය 36 ක් දක්වා අඩු කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව කිසිදු වලංගු හේතුවකින් තොරව 2016 ජූලි මස බැංකු සහායකයන් 99 ක් බඳවාගෙන තිබුණි.

(vi)

(ආ) සේවකයන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රගතිය

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බදුල්ල ශාඛාවේ වංචනික ක්‍රියාවේ නිරතවූ සේවකයකුගෙන් වංචා සහගත මුදල් රු. 8,883,042 ක් අය කර ගැනීමට තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් රු. මිලියන 2.5 ක් පමණක් අය කරගෙන තිබුණි. මෙම ශේෂය අයකර ගැනීම සම්බන්ධයෙන් ඔහුට දැනුම් දී තිබුණද 2017 ජූනි 30 වන විටත් එම මුදල නැවත නොගෙවා තිබුණි.

(ii) 2017 ජනවාරි වන විට 2009 වර්ෂයේ අලුතින් පත් වූ ප්‍රවාහන කළමණාකරුට විරුද්ධව පැවති විනය පරීක්ෂණය අවසන් වී තිබුණි. ඒ අනුව එම නිලධාරියාට තදින් අවවාද කිරීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද, 2017 අගෝස්තු වන විටත් ඔහු ඔහුගේ ස්ථිර තනතුර වන ප්‍රවාහන කළමණාකරු තනතුරේ ස්ථානගත කිරීමට ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

---

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකුවේ අංශ පහකට එනම් ශාඛා කළමණාකරණ, අලෙවිකරණ, වත්කම් කළමණාකරණ, තොරතුරු තාක්ෂණය සහ පරිශ්‍ර සම්බන්ධ ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කර තිබූ අරමුණු 17 ක් සලකා බලන කාලය තුළ ක්‍රියාත්මක නොවී පැවතුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම පරිදි තැපැල් බැංකු අංශයට ලබා දුන් ඉතිරිකිරීම් අරමුණු 5 ක සියයට 58 ට වඩා අඩු ප්‍රගතියක් පැවතුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

---------------------

අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 73 ක් වුවද, 2016 වර්ෂය සඳහා තත්‍ය සේවක සංඛ්‍යාව 52 ක් විය. ඒ අනුව, 2016 දෙසැම්බර් 31 දිනට, අංශයේ කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩු 30 ක් හා අතිරික්ත 09 ක් පැවතුණි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) සහ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු 01 ක් ඉහත පුරප්පාඩු තුළ ඇතුළත් විය. 2016 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු තනතුරු තුළ iii-i ශ්‍රේණියේ කළමණාකරු (විගණන) තනතුරු 10 ක්, iii-ii ශ්‍රේණියේ සහකාර කළමණාකරු තනතුරු 05 ක් පැවතුණි. අනුමත කාර්යය මණ්ඩලය තුළ භාෂා පරිවර්තකයෙකු (ඉංග්‍රීසි) ඇතුළත් කර තිබුණද, 2016 දෙසැම්බර් 31 වන විට අංශයේ තත්‍ය කාර්ය මණ්ඩලය තුළ කිසිදු අයෙකු එසේ පත් කර නොතිබුණු අතර එම අංශයේ පරිවර්තන වැඩ කටයුතු ප්‍රමාද වීමට එය හේතු විය හැකිය. එසේම 2017 මාර්තු සිට ක්‍රියාත්මක වන පරිදි සහකාර සාමාන්‍යාධිකාරී (විගණන) වැඩ බැලීමේ පදනම මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරට පත් කර තිබුණි.

## 6. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විගණනය අතරතුර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු වීම අවශ්‍ය කෙරේ.

| <u>පද්ධති හා පාලන</u> | <u>නිරීක්ෂණ</u> |
|---|---|
| ඉතුරුම් ප්‍රවර්ධනය | ඉතුරුම් ප්‍රවර්ධනය කිරීම බැංකුවේ අරමුණ වුවද , බැංකු අංශයේ වැඩි වීම සමඟ සැසඳීමේදී ඉතුරුම්වල වාර්ෂික වැඩි වීම වඩා අඩු බව දැක්විණි. |
| වෙළඳපල කොටස පවත්වාගෙන යාම | වෙළඳපල කොටස අඛණ්ඩව අඩු වන බව නිරීක්ෂණය වූ නිසා බැංකුවට එය පවත්වා ගැනීමට හෝ ඉහළ නංවා ගැනීමට සැලැස්මක් තිබිය යුතුය. |
| බැඳුම්කර නිකුතුවෙන් ලද මුදල් උපයෝජනය කිරීම | නිකුත් කිරීමේ ලියවිල්ල ප්‍රකාරව යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට පහසුකම් සැලසීමට බැඳුම්කර නිකුතුවෙන් ලද එක්සත් ජනපද ඩොලර් මිලියන 250 ක මුළු මුදලම බැංකුව 2014 වර්ෂයේ සිට උපයෝජනය කර නොතිබුණි. |